// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1985/37 - 2016 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.09.23
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පුපුරන ද්‍රව්‍ය ආඥාපනත

1956 අංක 21 දරන පුපුරන ද්‍රව්‍ය ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආරක්ෂක අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන වන මා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති,
ආරක්ෂක අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. 2000 මැයි 24 වැනි දින ප්‍රකාශිත අංක 1133/13 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 23/5 දරන 1979.02.13 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 1979 පුපුරන ද්‍රව්‍ය නියෝග වල සඳහන් පස්වන උපලේඛනය වෙනුවට පහත දක්වෙන නව උපලේඛනය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

**පස්වන උපලේඛනය**

**බලපත්‍ර හා අවසරපත්‍ර සඳහා ගාස්තු**

| | *I තීරය* | *II තීරය* |
|---|---|---|
| 01 | පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වූ බලපත්‍රය | |
| | (අ) ගල් වෙඩි බෙහෙත් නිෂ්පාදනය සඳහා පමණක් | රු. 2,000.00 |
| | (ආ) ආරක්ෂිත සේවා නූල් නිෂ්පාදනය සඳහා පමණක් | රු. 4,000.00 |
| | (ඇ) ගල් වෙඩි බෙහෙත් ආරක්ෂිත සේවා නූල් යන දෙවර්ගයම නිෂ්පාදනය සඳහා | රු. 7,000.00 |


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**පස්වන උපලේඛනය (සම්බන්ධිතයි)**

**බලපත්‍ර හා අවසරපත්‍ර සඳහා ගාස්තු**

| | *I තීරය* | *II තීරය* |
|---|---|---|
| | (ඇ) අනෙකුත් පුපුරණ ද්‍රව්‍ය | |
| | I කි. ග්‍රෑ. 12,000 නොඉක්මවන ප්‍රමාණයන් සඳහා | රු. 1,000.00 |
| | II කි. ග්‍රෑ. 60,000 නොඉක්මවන ප්‍රමාණයන් සඳහා | රු. 2,000.00 |
| | III කි. ග්‍රෑ. 60,000ට වැඩි ප්‍රමාණයන් සඳහා | රු. 5,000.00 |
| 02. | පුපුරන ද්‍රව්‍ය ආනයනකරුවකුගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වන බලපත්‍රය, | |
| | (අ) වාණිජ්‍ය කාර්යයන් සඳහා ආනයනය කිරීම ; | |
| | I කි. ග්‍රෑ. 50,000 නොඉක්මවන ප්‍රමාණයන් සඳහා | රු. 10,000.00 |
| | II කි. ග්‍රෑ. 50,000ට වැඩි ප්‍රමාණයන් සඳහා | රු. 25,000.00 |
| | (ආ) වෛද්‍ය හෝ පර්යේෂණ කාර්යයන් සඳහා ආනයනය කිරීම. | රු. 5,000.00 |
| 03. | පුපුරන ද්‍රව්‍ය සපයන්නෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන බලපත්‍රය, | |
| | (අ) ගිණිකෙළි භාණ්ඩ සඳහා පමණක් ; | |
| | I කි. ග්‍රෑ. 250 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 500.00 |
| | II කි. ග්‍රෑ. 250ට වැඩි කි. ග්‍රෑ. 12,000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 1,000.00 |
| | III කි. ග්‍රෑ. 12,000ට වැඩි කි. ග්‍රෑ. 60,000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 2,000.00 |
| | IV කි. ග්‍රෑ. 60,000ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 5,000.00 |
| | (ආ) වෙනත් පුපුරන ද්‍රව්‍ය සඳහා ; | |
| | I මෙ. ටො. 120 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 10,000.00 |
| | II මෙ. ටො. 300 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 20,000.00 |
| | III මෙ. ටො. 300ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 50,000.00 |
| 04. | පුපුරන ද්‍රව්‍ය අත්කරගැනීම සන්තකයේ තබා ගැනීම සහ පාවිච්චි කිරීම සඳහා වන අවසර පත්‍රය, | |
| | (අ) පෞද්ගලික පාවිච්චිය සඳහා ; | |
| | I කි. ග්‍රෑ. 100ට අඩු ප්‍රමාණ සඳහා | රු. 250.00 |
| | II කි. ග්‍රෑ. 100ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 500.00 |
| | (ආ) වානිජ්‍යය කටයුතු සඳහා ; | |
| | I කි. ග්‍රෑ. 1000ට අඩු ප්‍රමාණ සඳහා | රු. 1,000.00 |
| | II කි. ග්‍රෑ. 1000ට වැඩි කි. ග්‍රෑ. 4000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 2,000.00 |
| | III කි. ග්‍රෑ. 4000ට වැඩි කි. ග්‍රෑ. 40,000 නොඉක්මවන ප්‍රමාණ සඳහා | රු. 4,000.00 |
| | IV කි. ග්‍රෑ. 40,00ට වැඩි ප්‍රමාණ සඳහා | රු. 10,000.00 |
| 05. | පුපුරන ද්‍රව්‍ය අපනයනකරුවෙකුගේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා වන බලපත්‍රය | රු. 2,000.00 |

**පස්වන උපලේඛනය (සම්බන්ධිතයි)**

**බලපත්‍ර හා අවසරපත්‍ර සඳහා ගාස්තු**

| | *I තීරය* | *II තීරය* |
|---|---|---|
| 06. | නැති වූ හෝ විනාශ වූ සෑම බලපත්‍ර හෝ අවසරපත්‍ර පිටපතක් සඳහා | අදාළ බලපත්‍ර/ අවසරපත්‍ර ගාස්තුවෙන් 50% |
| 07. | පුපුරන ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ පාවිච්චි කිරීම සඳහා වන අවසර පත්‍ර | රු. 2,000.00 |
| 08. | අන්තරායකාරී නෞකා භාණ්ඩ නිෂ්කාශන සම්බන්ධ අවසර පත්‍ර ; | |
| | I (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයින් සඳහා ඉවත් කිරීමේ අවසර පත්‍ර | රු. 1,500.00 |
| | II (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයින් සඳහා ඉවත් කිරීමේ හා නැව්ගත කිරීමේ අවසර පත්‍ර | රු. 1,500.00 |
| | III (නාවික හා ගුවන්) නිෂ්කාශන නියෝජිතයින් සඳහා අන්තර් ප්‍රවාහන අවසර පත්‍ර | රු. 1,500.00 |
| | IV (නාවික හා ගුවන්) නිෂ්කාශන සඳහා අවසර පත්‍ර | රු. 1,500.00 |
| | V ගිනිඅවි සමඟ ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුළුවන නැව් සඳහා අවසරපත්‍ර ගාස්තුව | රු. 5,000.00 |

02. බර අනුව දක්වා නොමැති පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණයන් තීරණය කිරීම සඳහා වන තුල්‍යතා චක්‍රය

(අ) සේවා නූල් මීටර් 500ක ප්‍රමාණයක් කි. ග්‍රෑ. එකක් ලෙස සැලකිය යුතුය.
(ආ) ඩෙටොනේටර්ස් ගණනින් 500ක ප්‍රමාණයක් කි. ග්‍රෑ. එකක් ලෙස සැලකිය යුතුය.
(ඇ) ඩෙටොනේටින් කෝඩ් මීටර් 500ක ප්‍රමාණයක් කි. ග්‍රෑ. එකක් ලෙස සැලකිය යුතුය.
(ඈ) පතරොම් ගණනින් 250ක ප්‍රමාණයක් කි. ග්‍රෑ. එකක් ලෙස සැලකිය යුතුය.

03. ඉහත සඳහන් සංශෝධිත නියමයන් 2016 ඔක්තෝම්බර් මස 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

10-192

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.